We Deliver Results....

Susantha Katugampala
Barrister & Solicitor
*Immigration Lawyer*
*Migration Agent Reg: 96/86306*

FAIRFIELDS
IMMIGRATION LAWYERS - MELBOURNE

Tel : (03) 9650 4557 Fax : (03) 9650 4559
10 Morrison Place East Melbourne 3002

26 පිටෙන්

ආකර්ශණීය පෙනුමක් සුදු රෝස මලක නැහැ..... නමුත් ගැඹුරු මුහුදු පතුලක්, නිල් අහසෙ අනන්තයක් දුරක් වගේ දෙයක්ගැන හිතත්දි දැනෙන විදිහෙ නිශ්චලත්වයක්, නැවුම්බවක්, සුන්දරත්වයක් සුදු රෝස මලේ මම දකිනව ටාන්‍යා... ඔයත් හරියට ඒ වගේ..."

මේ මා කාලයක් තිස්සේ ඈ පිළිබඳ තක්සේරු කරගෙන සිටි දෙයකි. පාලනයකින් තොරව එය මගේ මුවින් පිටවිය. ටාන්‍යා ඊට පිළිතුරක් දෙන්නට ගියේ නැත. ඈ සුසුමක් හෙලා නිහඬ විය.

මීට වඩා ගැඹුරින් දෙයක් අපි කතා නොකෙරුවෙමු. අපි නිහඬව ම ඈ නැවතී සිටි ස්ථානය වෙත ඇවිද ගියෙමු. ඈ සමඟ රෑ වනතුරු රැඳී සිටිය යුතු යැයි මා සිතා සිටියේ නැත. ඈ මගේ රෑ කෑම ගැන විමසන්න ගියේ ද නැත. ඈ දොරටුව අසලට ම ඇරලවා මා ආපසු හැරෙන මොහොතේ ටාන්‍යා නැවත කටහඬ අවදි කළා ය.
-ලහිරු, හෙට උදේ ම එන්න පුළුවන් ද මාව එක්කගෙන යන්න."
-කොහේට ද?"
-අර ඈත පේන කන්දක් මුදුනට..." ඈත කන්දක් දිශාවට ඈ අත දිගු කර පැවසුවේ කුඩා දැරියක මෙනි.
-හොඳයි, මම එන්නම්..."
-කීයට ද?"
-උදේ හතට..." මම ආපසු හැරී මා නැවතී සිටි ස්ථානයට පැමිණියෙමි.

මගේ කාමරය පිටුපස ඇති සඳළු තලය කෙළින්ම විවෘත වන්නේ වැව රවුමේ දර්ශනයට ය. මම එදා රෑ ඒ දෙස ආශාවෙන් බලා සිටියෙමි. ඈත සඳ එළියත්, රන් පැහැගත් වැව් දියත් මගේ සිතතුල පිරීපැවති චමත්කාරයට සාක්ෂිදරන්නේ යැයි මට සිතිනි. මේ කරන්නේ කුමක් දැයි මගෙන් ම මම ප්‍රශ්න කරන්නට නොගියෙමි. හෙට උදේ ටාන්‍යාව රැගෙන යන්නේ කොහේ දැයි සිතන්නට ද නොගියෙමි. මා කොහේදෝ තැනක කියවා තිබූ ඉංග්‍රීසි කියමනක් සිහියට නැගින.

'ආදරය බෝට්ටුවක් මෙන් ය, ඔබ එය ඉවතට පැද යාමට ඉඩ දුන්නහොත්, ඊළඟ වතාවේ එය වරාය කරා පැමිනෙවිට, වෙනත් අයෙක් ඒ තුළ සිටීමට බොහෝ දුරට ඉඩ ඇත.......'

මා පසුදා උදේ ටාන්‍යාව රැගෙන ඒමට පොරොන්දු වූ වේලාවටම ගියෙමි. කලින්දාම දුරකථනයෙන් කොළඹට කතාකර නිවාඩුවක් අනුමත කරවාගත්තෙමි. ඒ නිවාඩුව ඇත්තෙන් ම කටවචනයට ලබාගත්තකි. මා පිටත්ව යන්නේ සියලු ම වැඩකටයුතු නිමකර බව ඔවුන් දනී.

ටාන්‍යා මඟබලා සිටියේය. ඈ ඇද සිටියේ සුදු පැහැති ගවුමකි. ඒ ඇයි දැයි මම ඇගෙන් ඇසීමට නොගියෙමි. ඒ ඇගේ හුරුපුරුදු වර්ණය බව මම දනිමි. ඇය වාහනයට නංවාගත් මා තුළ යායුතු දිශාව පිළිබඳ හැඟීමක් විය. නුවර රෝහල අසලින් කඳුකරය දෙසට දිවෙන මාර්ගය මම තෝරාගතිමි. ඊට පෙර යමක් කෑමට එන්න යැයි ඈට ආරාධනා කළ ද ටාන්‍යා එය ප්‍රතික්ෂේප කළාය. එබැවින් ම සිසිල් බීම බෝතල් දෙකක් සහ කෑම ස්වල්පයකුත් බේක්හවුස් එකෙන් අරගත්තේ මේ ගමන කීයට ආපසු ඒවිදැයි හැඟීමක් නොවූ බැවිනි. මා බලාපොරොත්තු වූයේ හන්තාන තේ වත්ත දෙසට ඈ කැඳවාගෙන යාමටය. කිසිවක්ම නොකියා ටාන්‍යා නිහඬවම වීදුරුවෙන් පිටත බලා සිටියාය. මම ද නිහඬව ම රථය පැදවූයෙමි. අපි බොහෝ දුර එසේ ගියෙමු.

මේ වන විට තම තමන්ගේ දෛනික දිනචර්යාව වෙනුවෙන් පිටත්ව යාමට මිනිසුන්, ගැහැනුන්, සහ ළමයින්, බොහොමයක් මහපාරට ගොඩවී සිටියේය. දෙපසින් අපව පසුකර යමින් සිටි ඒ මිනිසුන් දෙස ටාන්‍යා බලමින් සිටියේ මහත් උද්දාමයකින් යැයි මට සිතිනි. ඒ මදිවාට ඈ නොකඩවාම ඔවුන්ට අත වනන්නටද පටන් ගැනීම මට මහත් කරදරයක් විය. එපා යැයි කිව්වහොත් ඈ සිත රිදවා ගනී දැයි සිතා මම කරබා ගතිමි. මා කිහිප විටක් කණ්නාඩියෙන් පිටුපස බලන ලද්දේ පෙරලා ඇයට අතවනන කිසිවකුත් අප පසුපස එන්නේ නැත යැයි සැක හැර දැනගැනීමටය. මඳ දුරක් ගිය විට ඒ කලබලය තුනී වී ගියේය. මා එකවරම කාරය නැවැත්වූයේ එසේ කරන්න යැයි ඈ හදිසියේ කෑ ගසා සිටි බැවිනි.
-මොකෝ ටාන්‍යා මොකක්ද කලබලය?"
-පොඩ්ඩක් නවත්වන්න ලහිරු ඔයාව කලබල කළාට සමාවෙන්න... ඔහොම ටිකක් නවත්වන්න..."

වාහනය නැවැත්වූ වහා ම ටාන්‍යා ඉන් පිටත දිව ගියේ කොහේට දැයි මම කරපොවා බැලුවෙමි. වංගුවක් අසල මල් පොකුරක් අත තබාගත් දැරියක් වෙතට ඈ දිවගොස් තිබිණි. එතන සිට ඈ මට ද හඬගසයි. දැරිය අත වූයේ සුදු පාට ලිලී මල් කිහිපයකි.

-ලහිරු.... ඔයාට පුළුවන් ද මට ඡායාරූපයක් අරන් දෙන්න කරුණාකරලා."

දණ බිම ඔබා හිඳගත් ටාන්‍යා ඒ දැරිය තුරුළු කරගෙන මා ඡායාරූපය ගන්නා තෙක් සිනාවෙමින් සිටියේය. ඡායාරූපය ගන්නා අතර මා සිතුවේ පත්තර කාරයකුට නම් ඒ බොහෝ සේ වටිනා ඡායාරූපයක් විය හැකි බවයි. කැමරාවේ කාචය තුළින් ඔවුන් දෙදෙනාගේ ම මා දුටු එක් සමානකමක් විය. එනම් සුදෝ සුදු දත් දෙපලයි. ඒ සිනහවේ සටහන්ව තිබූ සතුට ද එලෙසින් ම සමාන කළ හැක්කක් බව නිසැකය.....

ඈත බලන විට නිල් අහස පමණක් පෙනෙන තරම් මුදුනකට රථය පැද වූ පසු මම එය වංගුවක් අසල ඉඩකඩ ඇති ස්ථානයක අයින්කර නැවැත්වුවෙමි. රථයෙන් ඉවත පැමිණි ටාන්‍යා බොහෝ වේලාවක් තේ පඳුරු අතර ගත කළාය. ඉර එළිය සමහර තැන්වලට මේ වන විටත් හරි හැටි නොලැබෙමින් තිබුණේ මීදුම නිසාය. ඇයට ඇතිතාක් වේලාවක් එසේ ඉන්නට ඉඩ දිය යුතු යැයි මම සිතා සිටියෙමි. ගල් කන්ඩියක් මතට ගොඩ වී මාර ගසකට හේත්තු වී මම ටාන්‍යා දෙස බලා සිටියෙමි. මේ මගේ හදවත දිනාගත් යුවතියයි. නමුත් මා සතුට ඇත්තේ තහනම් ආදරයකි. මහේල විසින් ඈ වෙත පළඳවන ලද මුදුව තවමත් ඈ අතය. ටාන්‍යාත් මාත් මැදිකර ගත් සිතිවිලි අතීතය තුළ දී විනා අනාගතය තුළ දී මට හමු නොවන්නක් විය හැකි යැයි මගේ සිත කියයි.....

ලබන කලාපයට